රජයේ නිවේදන

සුරාබදු ආඥා පනත

සුරාබදු නිවේදන අංක 05/2022

මෘදු මත්පැන් බලපත්‍ර

සුරාබදු ආඥා පනතේ (52 වැනි අධිකාරය) 25 වන වගන්තිය සමඟ කියවිය යුතු 32 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, සුරාබදු ආඥාපනතේ 7.(අ) වගන්තියෙන් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට පැවරී ඇති බලතල අනුව, සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනය උදෙසා අවශ්‍ය නම්‍යශීලී උපායමාර්ගික ප්‍රවේශයක් ලෙස සංචාරකයන්ගේ පහසුව පිණිස, ආහාරපාන සපයනු ලබන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් සහ ආපනශාලා සඳහා සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇති සංචාරක කලාපවල පිහිටි නවාතැන් හා සේවා සපයනු ලබන සංචාරක ආයතන සඳහා වයින් හා බියර් ඇතුළු පැසවීම මගින් නිපදවා ගනු ලබන මත්පැන් (මෘදු මත්පැන්) පමණක් පහත සඳහන් කොන්දේසි හා සීමා කිරීම්වලට යටත්ව අදාළ පරිශ්‍රය තුළ භාවිතා කිරීමට බලය දෙමි.

මෙම රීති 2022 ජූලි මස 28 දින සිට බලපැවැත්වේ.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 ජූලි මස 28 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

## රීති

1. සුරාබදු ආඥා පනතේ (52 වන අධිකාරය) 18 වන වගන්තිය යටතේ වන විධිවිධාන හා සමානාකාරව වයින් හා බියර් ඇතුළු පැසවීම මඟින් නිපදවා ගනු ලබන මත්පැන් (මෘදු මත්පැන්) අදාළ පරිශ්‍රය තුළ භාවිතා කිරීම සඳහා පමණක් මෙම බලපත්‍රය අදාළ හා බලාත්මක විය යුතුය.

2. මෙම අවසරය,

   (අ) I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි වී ඇති බවට එම අධිකාරිය විසින් නිර්දේශ කරනු ලබන ආයතන මඟින් සහ;

   (ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇති සංචාරක කලාපවල, එම අධිකාරිය නිර්දේශ කරනු ලබන, සංචාරකයන්ගේ පහසුව පිණිස ආහාරපාන සහ නවාතැන් පහසුකම් සපයනු ලබන සංචාරක ආයතන මඟින්

   මෘදු මත්පැන් අදාළ පරිශ්‍රය තුළ භාවිතා කිරීම සඳහා පමණක් අදාළ කරගත යුතුය.

3. අයදුම්කරන අවස්ථාවේ දී ලබාදෙන ලද හා අනුමත කරන ලද පරිශ්‍රයෙහි මායිම් සීමාවන් තුල පමණක් මෘදු මත්පැන් පරිභෝජනයට අවසර ඇත.

4. අයදුම් කරනු ලබන ස්ථානය සඳහා සංචාරකයින් ගේ පහසුව උදෙසා ආහාරපාන හා සේවාවන් සැපයීම පිණිස ලබා ගන්නා ලද ප්‍රවර්ථන කාලසීමාව සඳහා වලංගු, 1987 අංක 7 දරන ව්‍යාපාර නාම පනත අනුව ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ සමාගමක් සම්බන්ධයෙන් නම්, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු මඟින් සහතික කළ සමාගම් ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

5. පසුගිය වසර පහක (5) කාලය තුල දී, දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ සුරාබදු ආඥා පනත යටතේ හෝ චරිතයට අදාල වෙනත් වරදක් හෝ සම්බන්ධයෙන් වැරදිකරු වී නොමැති බව ප්‍රකාශ කෙරෙන ඉල්ලුම්කරුගේ දිවුරුම් ප්‍රකාශයක් හා ඉල්ලුම්කරු පසුගිය වසර පහක (5) කාලය තුල දී, දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ සුරාබදු ආඥා පනත යටතේ වරදකට වරදකරු වී නොමැති බවට බලපත්‍රලත් පරිශ්‍රය පිහිටා ඇති ප්‍රදේශයේ පොලිස් ස්ථානය භාර නිලධරයාගෙන් ලබාගත් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

6. අලුත් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන විට හෝ බලපත්‍ර දරන්නෙකු තම බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කරන විට හෝ ප්‍රතිපූරණය කරනු නොලබන රු. 5,000.00 ක ඉල්ලුම්පත්‍ර ගාස්තුවක් ගෙවිය යුතු අතර, එය ගෙවූ බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

7. මේ සඳහා වන බලපත්‍ර ගාස්තුව II වන උපලේඛනයෙහි පරිදි විය යුතු අතර, ඕනෑම බලපත්‍රයක් උපරිමය ලිත් වර්ෂයක කාල සීමාවක් සඳහා වලංගු විය යුතුය. කෙසේ වුව ද, වර්ෂය මැද නිකුත් කරනු ලබන නව බලපත්‍රයන්, එම ඉතිරි කාලය සඳහා එම වර්ෂයට අදාළ සම්පූර්ණ බලපත්‍ර ගාස්තුව ගෙවා නිකුත් කරනු ලැබිය යුතුය.

8. අනුමත තොග වෙළෙන්දෙකුගෙන් හැර වෙනත් තැනකින් අදාළ මෘදු මත්පැන් ලබාගැනීම තහනම් ය. අදාළ පරිශ්‍රය තුලට ගෙන එනු ලබන හා භාවිතා කරනු ලබන මෘදු මත්පැන් පිළිබඳ ගිණුම්, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කර ඇති ආකෘතිවල පවත්වාගෙන යායුතුය.

9. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ හා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ එකඟත්වයකින් තොරව බලපත්‍රය ලබා දෙනු ලබන පරිශ්‍රයේ අයිතිය වෙනස්වීමක් හෝ පැවරීමක් නොකළ යුතුය. එවැනි වෙනස්වීමක් බලාත්මක වනුයේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ හා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා අනුමත කිරීමෙන් පසුව හා රුපියල් ලක්ෂ දහයක (10) මුදලක් බැඳීමෙන් පසුවය.

10. මෙම රීති ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට, අදාල අනුමැතිය ලබා ගැනීමට අදහස් කරන සියළු තැනැත්තන් විසින් III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අයදුම් පත්‍ර ප්‍රකාරව අයදුම් කළ යුතු අතර, එකී ආකෘති පත්‍රය මඟින් පමණක් විශේෂ බලපත්‍රය නිකුත් කිරීමට සුරාබදු කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කළ යුතුය.

11. යම් පැමිණිල්ලක් ලැබුණහොත් ඒ පිළිබඳව සිදු කරනු ලබන පරීක්ෂණයකින් අනතුරුව අදාල බලය ලබාදීම, ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීම හෝ සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ අභිමතයට යටත් විය යුතුය.

12. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් හා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවා ඇති රීති කඩ කලහොත් මෘදු මත්පැන් භාවිතය සඳහා ලබා දී ඇති අනුමැතිය අවලංගු වන්නේය. තව ද, සුරාබදු ආඥා පනතේ විධාන අනුව මෙහි සඳහන් රීති කඩකර ඇති බව අනාවරණය වුවහොත් කාර්මික අපරාධ වාර්තා ඉදිරිපත් කරනු ලැබේ. ලබා දී ඇති අනුමැතිය වෙනස් කළ හැක්කේ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට පමණි.

13. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මඟින් හෝටලයට ලබා දී ඇති අනුමැතිය අවලංගු වුවහොත් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් මෘදු මත්පැන් භාවිතය සඳහා දී ඇති අනුමැතිය ඉබේම අහෝසි වේ.

14. පසළොස්වක පෝය දින වල දී මෘදු මත්පැන් පානයන් විකිණීමක් නොකළ යුතුය.

## I වන උපලේඛනය

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි නවාතැන් හා සේවා පහසුකම් සපයනු ලබන සංචාරක ආයතන

| අනු අංකය | සංචාරක ආයතන කාණ්ඩය | නවාතැන් හා සේවා පහසුකම් සපයනු ලබන සංචාරක ආයතන |
|---|---|---|
| 1 | නවාතැන් කාණ්ඩය | තරු පන්තියේ සංචාරක හෝටල් |
| 2 | | බුටික් හෝටල් |
| 3 | | බුටික් විලා |
| 4 | | පරිසර හිතකාමී නවාතැන් මධ්‍යස්ථාන |
| 5 | | පෞරාණික හෝටල් |
| 6 | | සංචාරක හෝටල් |
| 7 | | සංචාරක ආගන්තුක නිවාස |
| 8 | | සංචාරක නේවාසිකාගාර |
| 9 | | සංචාරක සත්කාරක නිවාස |
| 10 | | සංචාරක බංගලා |
| 11 | | පෞරාණික බංගලා |
| 12 | | පෞරාණික නිවාස |
| 13 | | කඳවුරු බිම |
| 14 | | තේමා මූලික කොටගත් නවාතැන් |
| 15 | | සංචාරක මහල් හෝටල් |
| 16 | සේවා කාණ්ඩය | සංචාරක ආපනශාලා |
| 17 | | ෆුඩ් කෝට් |
| 18 | | සංචාරක හිතකාමී ආහාර ගැනීමේ ස්ථාන |

## II වන උපලේඛනය - බලපත්‍ර ගාස්තුව

මෙම නිවේදනයෙහි විධිවිධාන යටතේ මෘදු මත්පැන් (Soft Liquor) පමණක් පරිශ්‍රය තුල භාවිතා කිරීමට ලබාදෙන බලපත්‍රය සඳහා අයකරනු ලබන ගාස්තුව

| බලපත්‍රය | වාර්ෂික ගාස්තුව |
|---|---|
| මෘදු මත්පැන් බලපත්‍රය | රුපියල් 25,000.00 |

## III වන උපලේඛනය - බලපත්‍රය ලබාදීමේ ආකෘතිය

මෙම නිවේදනයෙහි විධිවිධාන යටතේ මෘදු මත්පැන් (Soft Liquor) පමණක් පරිශ්‍රය තුල භාවිතා කිරීමට බලපත්‍රය ලබාදීමේ ආකෘතිය

### ශ්‍රී ලංකා සුරාබදු දෙපාතර්මේන්තුව

(1) දිස්ත්‍රික්කය : .................................... අනුමත අංකය : ....................................

නිකුත් කළ දිනය : .................................... අවලංගු වන දිනය: ....................................

ආයතනයේ වර්ගය : ..........................................................................................

ගාස්තුව : ....................................

මුද්දර ගාස්තුව : ....................................

(2) ආයතනයේ නම සහ ලිපිනය:

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

(3) සුරාබදු ආඥා පනත යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉහත සඳහන් ආයතනයේ 'මෘදු මත්පැන්' (Soft Liquor) පමණක් පරිශ්‍රය තුල භාවිතය සඳහා බලය දෙමි.

..................................................

දිනය : ................................ සුරාබදු කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
2. සහකාර සුරාබදු කොමසාරිස් (........................ පළාත)
3. සුරාබදු අධිකාරි (........................)
4. සුරාබදු ස්ථානාධිපති (........................)